නිවාස හා සමාජ සුභසාධන අමාත්‍යාංශය
සමාජ සුභසාධන අංශය
வீடமைப்பு மற்றும் சமூக நலன்புரி அமைச்சு
சமூக நலன்புரி பிரிவு
Ministry of Housing and Social Welfare
Social Welfare Division
1 වන මහල, "සෙත්සිරිපාය" 2 අදියර, බත්තරමුල්ල. 1வது மாடி, "செத்சிறிபாய" 2வது கட்டம், பத்தரமுல்ல. 1st Floor, "Sethsiripaya" 2nd Stage, Battaramulla

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | MHSW/NSPD/ චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2018.12. 10 |

අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 2018 / 02

සියලු ම දිස්ත්‍රික් ලේකම්වරුන්

<u>ආබාධ සහිත තැනැත්තන් සඳහා අධ්‍යාපන ආධාර ඉල්ලීම</u>

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක වන අධ්‍යාපන ආධාර ලබා දීමේ වැඩසටහන යටතේ ලබා දෙන උපරිම ආධාර මුදල රු.10,000/- ක් වේ. ඒ අනුව අධ්‍යාපන ආධාර ලබා දීම සඳහා අවශ්‍ය වන නිර්ණායක හා අයදුම්පත මේ සමඟ අමුණා ඇත. එම අයදුම්පත ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව පහත ලිපිනයට ඉදිරිපත් කිරීමට පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලමි.

අධ්‍යාපන ආධාර ලබා ගැනීම සඳහා අවශ්‍ය නිර්ණායක :-

- ආබාධ සහිත දරුවන් හා ආබාධ සහිත දෙමව්පියන්ගේ දරුවන් සඳහා මෙම ආධාරය හිමිය.

- මෙම ආධාරය හිමි වන්නේ එක් දරුවෙකු සඳහා එක් වතාවක් පමණි.

- මේ සඳහා ඉල්ලුම් කිරීමේදී, එක් අයදුම්පතක් භාවිත කළ හැක්කේ එක් දරුවෙකු සඳහා පමණි. (සුදුසුකම් ලද එකම පවුලේ දරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් සිටී නම් මේ සඳහා වෙන වෙනම ඉල්ලුම් කළ යුතුය.)

- ඒ සඳහා පහත සඳහන් ලේඛන අවශ්‍ය වේ.

  1. සම්පූර්ණ කරන ලද අයදුම්පත (විදුහල්පතිගේ නිර්දේශය / රු.6000/- කට අඩු ආදායමක් ලබන බවට සනාථ කරන ග්‍රාම නිලධාරී නිර්දේශය / සමාජ සේවා නිලධාරී නිර්දේශය හා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.)

  2. ඉල්ලුම්කරුගේ ඉල්ලීමේ ලිපිය

  3. ආබාධිත සහිත භාවය පැහැදිලිව සඳහන් වන රජයේ වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් (මාස 6ක් ඇතුළත ලබාගත්) වෛද්‍ය සහතිකය නිල මුද්‍රාව සහිතව තිබීම.(පිටපත් එවන්නේ නම් සමාජසේවා නිලධාරී / සංවර්ධන නිලධාරී විසින් එය සත්‍ය පිටපතක් බවට සහතික කල යුතු අතර , රෝග නිශ්චය තුණ්ඩු මෙහිදී සලකා බලනු නොලැබේ.)

4. ඉගනුම ලබන ශ්‍රේණියට අනුව උපරිමය රු:10,000/-කට යටත්ව වෙළඳ ආයතනයකින් ලබා ගත් මුද්‍රිත ලිපි ශීර්ෂයක හෝ මුද්‍රිත බිලක සැකසූ හෝ අතින් සකස් කළ මිල ගණන් ඇතුළත් පැහැදිළි ඇස්තමේන්තු වෙළඳ ආයතනයේ නිල මුද්‍රාව සහිතව ඉදිරිපත් කළ යුතු අතර, අතින් සකස් කළ ඇස්තමේන්තුවක් නම් පමණක් සමාජ සේවා හෝ සංවර්ධන නිලධාරී විසින් සත්‍ය බිලක් බවට සහතික කළ යුතුය.

(නිල ඇඳුම් /කිසිදු රෙදි වර්ගයක් සඳහා ආධාර ලබා නොදේ.)

❖ ලැබෙන ඇස්තමේන්තුව අනුව ඉල්ලුම් කරන ලද පාසල් උපකරණ වඩාත් වැඩි ප්‍රමාණයක් සහ නුසුදුසු ඉල්ලීම් කරන්නේ නම් ඒ සාධාරණ ලෙස සංශෝධනය කළ හැකිය.

උදා:- පැන් 24ක් ඉල්ලුම් කරන්නේ නම් එය 12 දක්වා අඩු කළ හැකිය.

❖ අධ්‍යාපන ආධාර ලබා දී ඇමුණුම් 1 මඟින් දින 30ක් ඇතුළත පසු විපරම් වාර්තාව ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව පහත ලිපිනයට ඉදිරිපත් කිරීම අනිවාර්ය බව සලකන්න.

අධ්‍යක්ෂ
ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ
ජාතික මහ ලේකම් කාර්යාලය
පළමු මහල
සෙත්සිරිපාය II අදියර
බත්තරමුල්ල

එස්.ඩී.උඩවත්ත
අතිරේක ලේකම්(පාලන)
ලේකම් වෙනුවට

පිටපත් :- 1. ප්‍රාදේශීය ලේකම් - කාරුණික දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
2. සමාජ සේවා අධ්‍යක්ෂ - කාරුණික දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
3. දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරී - ඉහත සඳහන් නිර්ණායක හා අයදුම්පත් මේ සමඟ එවමි.

අමාත්‍ය / அமைச்சர் / Minister } Tel : 011-2867163 Fax : 011-2861770 E-mail : minister@houseconmin.gov.lk
ලේකම් / செயலாளர் / Secretary } Tel : 011-2862225 Fax : 011-2864765 E-mail : secretary@houseconmin.gov.lk
කාර්යාලය / அலுவலகம் / Office } 11-2887349-51 11-2877127 : mssadmin@sltnet.lk